i. විතර්ක - තම භාවනා අරමුණුට සිත නැංවීම
ii. විචාර - එම අරමුණෙහි සිත හැසිරවීම
iii. ප්‍රීති - එම අරමුණෙන් සිත ප්‍රමෝද වීම
iv. සුඛ - එම විරුද්ධ අරමුණු වල සිත එල්බ වීම (විඳීම)
v. ඒකග්ගතා - විරුද්ධ අරමුණක සිත යළිත් යා නොදී එකී අරමුණෙහිම එල්බ ගැනීම

37 රහත් බව ලැබීමේදී ප්‍රහාණය වන පස් ආකාර සංයෝජනයන්

i. රූප රාග සංයෝජනය - රූපලෝකවල ඉපදීමේ ආශාව
ii. අරූප රාග සංයෝජනය - අරූප ලෝකවල ඉපදීමේ ආශාව
iii. මාන - සංයෝජනය - තමා හා තම කුලය පමණක් උසස්ය යන හැඟීම
iv. උද්ධච්ච සංයෝජනය - සිත නොවිසිරීම
v. අවිජ්ජා - චතුරාර්‍ය සත්‍ය පිළිබඳ නොදැන මුලාව

38 දන් දීමෙන් මෙලොව වශයෙන් ලද හැකි ආනිසංශ

i. ආයු - උපද්‍රවයන්ට භාජනය නොවී දිගුකල් ජීවත් වීම
ii. වර්ණ - පැහැපත් ඡවි වර්ණය
iii. සැප - ලෞකික වශයෙන් ලැබිය යුතු සම්පත් ලැබීම
iv. බල - කාය බලය මෙන් ම පිරිස් බලයද වැඩි වේ
v. ප්‍රඥා - තම නුවණ වඩා වර්ධනය වෙයි

39 පංචකාම ස්වර්ග (පස්කම් සැපතින් හෙබි දිව්‍ය ලෝක)

i. චතුර්මහා රාජිකය
ii. තාවතිංසය
iii. යාමය
iv. තුසිතය
v. නිර්මාණ රතිය

40 [illegible]

i. [illegible]
ii. [illegible]
iii. [illegible]
iv. [illegible]
v. භික්ෂුණිය

41 පින් ක්ෂයවී යාමෙන් දෙවියන් දෙව්ලොවින් චුතවීමේදී ඇතිවන පෙරනිමිති

i. තමන් පැළඳ සිටින නොයෙක් විසිතුරු මල් පරවීම
ii. තමන් පැළඳි සළු පිළි දුර්වර්ණ වීම
iii. තම කිසිලි දෙකෙන් දහඩිය ගැලීම
iv. තම ශරීරයේ වර්ණය අඩුවී දුර්වර්ණ වීම
v. තමන්ගේ විමානය හා හිඳසිටින අසුන් පිළිබඳ ආශාවක් නොමැති වීම

42 දුකෙහි අවස්ථා

i. ශෝක
ii. පරිදේව
iii. දුක
iv. දෝමනස්ස
v. උපායාස

ෂට්‍ය හෙවත් සය වැගින් සදෙව් ලොව
(දිව්‍ය ලෝක හය)

i. චාතුම්මහා රාජිකය
ii. තාවතිංසය
iii. නිම්මාන රතිය
iv. යාමය
v. තුසිතය
vi. පරනිම්මිත වසවත්තිය

1 සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් නමස්කාර කල යුතු සදිසාවන්

i. පුබ්බ දිසා (නැගෙනහිර) දෙමාපියන්
ii. පච්ඡිම දිසා (බටහිර) අඹු දරුවන්
iii. දක්ඛින දිසා (දකුණ) ගුරුවරුන්
iv. උත්තර දිසා (උතුර) මිතුරුයන්
v. උද්ධ දිසා (උඩ) ශ්‍රමණ බ්‍රාහ්මණයින්
vi. හෙට්ඨි දිසා (යට) දාසි දස් කම්කරුවන්

2 ෂඩ් වර්ණ හෙවත් බුද්ධ රශ්මි මාලාවේ අඩංගු වර්ණ හය

i. නීල - නිල් පැහැය
ii. පීත - කහ පැහැය
iii. ලෝහිත - රතු පැහැය
iv. ඕදාත - සුදු පැහැය
v. මාංජෙෂ්ඨ - මදටිය පාට
vi. ප්‍රභාශ්වර - සියළු පැහැයන් මිශ්‍ර වූ පැහැය

3 අනුස්සති (නැවත නැවතඅවර්ණනා කිරීම)

i. බුද්ධානුස්සති - බුදුගුණ නැවත නැවත සිහි කිරීම
ii. ධම්මානුස්සති - දහමෙහි ගුණ නැවත නැවත සිහි කිරීම
iii. සංඝානුස්සති - සඟරුවනේ ගුණ නැවත නැවත සිහි කිරීම
iv. සීලානුස්සති - තම සීලයෙහි ගුණයන් නැවත නැවත සිහි කිරීම
v. චාගානුස්සති - තම ත්‍යාගශීලී බව නැවත නැවත සිහි කිරීම

4 ෂඩායතන (අරමුණු ගන්නා තැන්)

i. චක්ඛු - ඇස (රූපයන් අරමුණු ගනී)
ii. සෝත - කණ (ශබ්දයන් අරමුණු ගනී)
iii. ඝාන - නාසය (ගඳ සුවඳයන් අරමුණු වේ)
iv. ජිව්හා - දිව (රසයන් අරමුණු වේ)
v. කාය - ශරීරය (සුව - දුක - ස්පර්ශ අරමුණු වේ)
vi. මන - සිත (ධර්මය අරමුණු වේ)

5 සයාකාර චරිත

i. රාග චරිත - රාගය හෙවත් ආශාවලින් පිරි චරිත
ii. ද්වේෂ චරිත - තරහව හෙවත් වෛරය පිරි චරිත
iii. මෝහ චරිත - ඇතිතතු නොදන සිහි මුලාවූ චරිත
vi. ශ්‍රද්ධා චරිත - තිසරණ කෙරෙහි සැදැහැ උපදවන චරිත
v. බුද්ධි චරිත - වලඹ සිටි නුවණින් සිහි බුද්ධියෙන් කටයුතු ...
vi. විතක්ක චරිත - තර්කානුකූලව සිතා කටයුතු කරන

6 බුදු රජුන්ගේ ෂඩ් අභිඥා

i. ඉද්ධිවිධං - යමාමහ පෙළහර ආදි සෘද්ධි ප්‍රතිහාරයන්
ii. දිබ්බසෝත - දෙව් - මිනිස් - බඹ ආදි සියලුම ලෝක ...
ශබ්ද ඇසෙන දිව කණ
iii. පරචිත්ත විජානනං - අන්‍යන්ගේ සිතිහි යථා ස්වභාවය
දන්නා නුවණ (චේතෝපරිය)
v. පුබ්බේනිවාසානුස්සති - සත්වයන්ගේ පෙර ආත්ම භවය
දක්නා නුවණ
v. දිබ්බ චක්ඛු - අතීත - අනාගත - වර්තමාන යන තුන් කල්
[illegible] දක්නා නුවණ
vi. ආසවක්ඛය - සියලු ආශාව හෙවත් කෙලෙස් නසනා නු...

සය චෛත්‍ය ආකාරයන්

i. ඝණ්ටාකාර - සීනුවක හැඩයට නිර්මාණ කළ චෛත්‍ය
ii. ඝටාකාර - කළගෙඩියේ හැඩයට නිර්මාණ කළ චෛත්‍ය
iii. බුබ්බුලාකාර - දිය බුබුලක හැඩයට නිර්මාණය කළ චෛ...
iv. ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩ ගැසූ කල පෙනෙන්නාසේ
(වී ගොඩක් මෙන්) නිර්මාණය කළ චෛත්‍ය
v. පද්මාකාර - පියුමක හෙවත් නෙළුම් මලක හැඩයට නිර්[illegible]
කළ චෛත්‍යය

vi. ආමලකය නෙල්ලි ගෙඩියක හැඩයට නිර්මාණය කළ කොටසය

8. අත්ථස්ස ද්වාර (දියුණුවට හේතුවන කරුණු)

i. නිරෝගී බව
ii. ආචාරශීලී බව
iii. ඇසිහිටි උපදෙස් පිළිපැදීම
iv. හොඳින් ඉගෙන ගැනීම
v. ධාර්මික දිවි පෙවෙත
vi. කම්මැලි හෙවත් කුසීත නොවීම

9. බුද්ධ ප්‍රතිමා නිර්මාණය කරණ මුද්‍රා

i. ධර්ම චක්‍ර මුද්‍රාව දහම් කරුණු පැහැදිලි කරන අයුරු
ii. ධ්‍යාන මුද්‍රාව - භාවනානුයෝගීව වැඩ සිටින අයුරු (සමාධි පිළිම)
iii. භූමි ස්පර්ශ මුද්‍රාව - පොළවට එක් හස්තයක් දිගු කර සිටින මුද්‍රාව
iv. අභය මුද්‍රාව - බිය නොවන්නැයි අඟවන මුද්‍රාව
v. විතර්ක මුද්‍රාව
vi. වරද මුද්‍රාව

10. සය ආකාර සත් පුරුෂ ලක්ෂණ

i. කළගුණ දන්නා බව
ii. උපකාරයට ප්‍රති උපකාර කිරීම
iii. නුවණැති බව
iv. කල්‍යාණ මිත්‍ර ලක්ෂණයෙන් පිරුණ බව
v. තම මිතුරන්ට ලැදි බව
vi. විපතකදී තම මිතුරාට උපකාරී වී ඔහු ඉන් මුදවා ගැනීම

11. බුදුවරුන්ගේ ෂඩ් අසාධාරණ ඥාණයන

i. ඉන්ද්‍රිය පරෝපරියත්ති ඥානය - සත්ත්වයන්ගේ සද්ධා දී ඉන්ද්‍රයන් පිළිබඳ දන්නා නුවණ
ii. යමක පාටිහාර ඥානය - යමාමහ පෙළහර ආදී සෘධි ප්‍රාතිහාර්ය දන්නා නුවණ
iii. මහා කරුණා සමාපත්ති ඥානය - සියලු ලෝ සතුන් වෙත පතල මහා කරුණා ඇත්තා වූ නුවණ

iv. සබ්බඤ්ඤුත ඥානය - ලොව ඇති හැමෙත් සියල්ල දන්නා නුවණ

v. ආසයානුසය ඥානය - සත්ත්වයන්ගේ ආශය (සිතෙහි ඇති කැමැත්ත) හා අනුශය දන්නා නුවණ

vi. අනාවරණ ඥානය - ලොව ඇති සියල්ල සියත් පතක වියෙ කලෙසේ දත හැකි නුවණ

12 සයාකාර තණ්හා

i. රූප තණ්හා - රූපය කෙරේ රාගය
ii. ශබ්ද තණ්හා - මිහිරි ශබ්දයන් කෙරේ රාගය
iii. ගන්ධ තණ්හා - සුවඳ කෙරෙහි ඇති රාගය
iv. රස තණ්හා - නොයෙක් අයුරු වූ රසයන් කෙරෙහි රාගය
v. ඵොට්ඨබ්බ තණ්හා - ස්පර්ශ හෙවත් කයට දැනෙන පහස කෙරේ රාගය
vi. ධම්ම තණ්හා - කුසල් අකුසල් කෙරෙහි පවත්නා රාගය

13 බුද්ධ ධර්මයෙහි පවත්නා ගුණ

i. ස්වාක්ඛාතො - මනාව දේශනා කර ඇති බව
ii. සන්දිට්ඨිකො - ඇසට පෙනෙන පරිදි විපාක දීම
iii. අකාලිකො - අතීත - වර්තමාන - අනාගත යන තුන් කාලයට සුදුසු වීම
iv. ඒහිපස්සිකො - විමසා තර්කානුකූලව ගත හැකි බව
v. ඕපනයිකො - නිවන් මාවතට පමුණුවා ලන බව
vi. පච්චත්තං වේදිතබ්බො - තම තම නැණ පමණින් අවබෝධ කටයුතු බව

14 පෙරවිසූ තද පිළිවෙල හෙවත් පූර්ව භවයන් පිළිබඳ දන්නා අය

i. ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා - අසීමිත කල්පයක් අතීතය දනිති
ii. පසේ බුදුවරු - අසංඛ්‍ය කල්ප ලක්ෂයක් අතීතය දනිති
iii. අග්‍ර ශ්‍රාවකයන් - ඒකාසංඛ්‍ය කල්ප ලක්ෂයක් අතීතය දනිති
iv. මහා ශ්‍රාවකයන් - කල්ප ලක්ෂයක් අතීතය දනිති
v. ප්‍රකෘති ශ්‍රාවකයන් - ඒකාසංඛ්‍ය කල්ප ලක්ෂයක් අතීතය දනිති
vi. තීර්ථකයන් - හතලිස් කල්පයක් අතීතය දනිති

ෂඩ් ශාස්තෘවරුන්

i. පූර්ණ කස්සප
ii. මක්ඛලී ගෝසාල
iii. අජිතකේශ කම්බල
iv. පකුධ කච්චායන
v. සංජය බෙල්ලට්ඨි පුත්ත
vi. නිඝන්ඨනාථ පුත්ත (මහාවීර - ජෛනාගමේ නායකයා)

වන්දනීයත්වයට සුදුසු වන ධර්මතා

i. ශ්‍රද්ධාව - තුණු රැවණ කෙරෙහි පැහැදීම ඇති බව
ii. වීර්යය - කුසල් ඉපදවීම සඳහා වීර්යය කිරීම
iii. සතිය - මනා සිහිකල්පනාවෙන් යුතු වීම
iv. සමාධිය - සිත ඒකග්‍රතාවයෙන් යුතු වීම
v. ප්‍රඥාව - මනා නුවණැති බව
vi. ආසවක්ඛය - සියලු ආශ්‍රව හෙවත් බැඳීම් පල්වීම් වලින් වෙන්වීම

ධන සම්පත් පිරිහෙන මාර්ග

i. සුරාමේරය - ප්‍රමාදයට හා මත්වීමට හේතුවන සුරා පානය
ii. විකාලවිසිඛානු - අවේලාවන්හි වීථි සංචාරය
iii. සමජ්ජාභිචරණානු - නෘත්‍ය නැරඹීමට යාම
iv. ජූතප්පමාදට්ඨාන - දූ කෙළියේ යෙදීම
v. පාපමිත්තතා - පාප මිත්‍ර සේවනය
vi. ආලස්සානු - අලස කුසීත බව

සය වැදෑරුම් මහා භූත

i. පඨවි ධාතු - පොළෝතලය (පෘතිවිය)
ii. ආපෝ ධාතු - වැගිරෙන දේ ජලය ආදි
iii. තේජෝ ධාතු - ගින්දර
iv. වායෝ ධාතු - වායුව
v. ආකාශ ධාතු - අවකාශය - අහස
vi. විඤ්ඤාණ ධාතු - දැනීම, හැඳිනීම

සත්හත ගෙවන් ගන බැගින්

බුදුන් වහන්සේ සත්සති ගතකළ ස්ථානයන්

i. පඨමං බෝධි පල්ලංකං - පළමුවන සතිය තමන් වහන්සේට පිහිට උපකාරී වූ බෝධි රාජයානන් මුලයේ වජ්‍රාසනය මත

ii. දුතියංච අනිමිසං - දෙවන සතිය බෝධින් වහන්සේ සමීපයෙහි එදෙස ඇසිපිය නොහෙළා බලා සිටීම (අනිමිස ලෝචන පූජාව)

iii. තතියං චංකමනං - තෙවන සතිය රුවන් සක්මනෙහි යෙදුණු සේක

iv. චතුත්ථං රතනාඝරං - හතරවන සතිය රුවන් ගෙය තුළ වැඩ සිටි සේක

v. පංචමං අජපාලංච - පස්වන සතිය අජපාල නුගරුක මුල

vi. මුචලින්දේන ඡට්ඨමං - සවැනි සතිය - මුචලින්ද නා රජුගේ දරණ තුළ

vii. සත්තමං රාජායතනං - සත්වැනි සතිය - රාජායතන කිරිපලු රුක මුල වැඩ සිටිසේක

2 සත් රුවන්

i. රන්
ii. රිදී
iii. මුතු
iv. මැණික්
v. වෙරළ මිණි(වෛඩූර්ය)
vi. දියමන්ති
vii. පබළු

3 මහා මේරුව හෙවත් සුනෙර පර්වතය වටා පිහිටියේ යැයි සඳහන් සත්කුළු පව්

i. යුගාන්ධර
ii. ඊශධර
iii. කරවීක
iv. සුදර්ශන
v. නෙමින්ධර

vi. විනතක
vii. අශ්වකර්ණ

සප්ත බොජ්ඣංග (සම්බෝධිය පිණිස හේතුවන ධර්ම)

i. සති සම්බොජ්ඣංග - මනාවූ සිහියෙන් යුතු වීම
ii. ධම්මවිචය සම්බොජ්ඣංග - කය හා මරණය ගැන විමර්ශනය කිරීම
iii. විරිය සම්බොජ්ඣංග - එකී කාර්යය සපුරා ගැනීම වීර්යය කිරීම
iv. පීති සම්බොජ්ඣංග - එමගින් ලැබෙන ප්‍රීතිය
v. පස්සද්ධි සම්බොජ්ඣංග - එමගින් මානසිකව ඇතිවන සංසුන් බව
vi. සමාධි සම්බොජ්ඣංග - මානසික ඒකාග්‍රතාව
vii. උපෙක්ඛා සම්බොජ්ඣංග - මැදිහත් බව

සප්ත ආර්ය පුද්ගලයින්

i. සද්ධානුසාරී - තිසරණ කෙරෙහි මනාවූ ශ්‍රද්ධාව ඇති අය
ii. සද්ධා විමුත්තො - ශ්‍රද්ධාව නිසා සසරින් මිදුන අය
iii. කාය සක්ඛි - කය සාක්ෂි කරගත් අය
iv. උභතො විමුක්ති - ක්‍රම දෙකකින් සසරන් මිදුන අය
v. ධම්මානු සාරි - ධර්මය අනුගමනය කරන්නා
vi. පඤ්ඤා විමුත්තො - ප්‍රඥාව මෙහෙයවා විමුක්තියට පත් අය
vii. දිට්ඨි පත්තො - සම්‍යක් දෘෂ්ටිය වැඩූ අය

ඇසුරු කළ යුතු මිතුරන්ගේ ලක්ෂණ

i. දුද්දදං දදාති - දිනා වටිනා දීමට අසීරු දේ පවා පරිත්‍යාග කරති
ii. දුක්කරං කරොති - දිනාමත් අසීරු කාර්යයන් ඉටුකර දෙයි
iii. දුක්ඛං ඛමති - ඉවසීමට අසීරු අවස්ථා ඉවසති
iv. ගුය්හං අස්ස අවිකරෝති - තම රහස් හෙළි කරති
v. ගුය්හං අස්ස පරිගුය්හති - රැකිය යුතු රහස් රකිති
vi. ආපදාසු නජහති - විපතේදී මිතුරා අත් නොහරිති
vii. ඛිණෝ නාතිමඤ්ඤති - තම මිතුරාට නින්දා නොකරති

7 කාම සම්පත් පිරි ස්වර්ග හත

i. මනු ලොව
ii. චතුර්මහා රාජිකය
iii. තාවතිංසය
iv. යාමය
v. තුසිතය
vi. නිම්මානරතිය
vii. පරිනිම්මිත වසවත්තිය

8 සප්ත ප්‍රකරණ (අභිධර්ම පිටකයේ ප්‍රභේද)

i. ධම්ම සංගණී - ආචාර ධර්ම
ii. විභඞ්ග - එකී කරුණු විග්‍රහය
iii. කථාවත්ථු - දාර්ශනික විෂයයන් පිළිබඳ
iv. පුග්ගල ප්‍රඥප්ති - පුද්ගල ගති පිළිබඳ
v. ධාතුකථා - මූල ධර්ම විග්‍රහය
vi. යමක - යුගල බැගින් වූ දහම් කරුණු
vii. පට්ඨාන - හේතුඵල ධර්ම විග්‍රහය

9 සප්ත ආර්‍ය්‍ය ධන

i. ශ්‍රද්ධා - ශ්‍රද්ධාව ඇති බව
ii. ශීල - මනා සිල්වත් බව
iii. හිරි - පව් කිරීමට ඇති ලැජ්ජාව
iv. ඔත්තප්ප - පව් කිරීමට ඇති බිය
v. සුත - බහුශ්‍රැත බව (බොහෝ ඇසූ පිරූ තැන් ඇති)
vi. චාග - ත්‍යාගශීලි බව
vii. පඤ්ඤා - නුවණැති බව

10 සප්ත අනුසය ධර්ම (යටපත්ව තිබෙන සංස්කාර)

i. කාමරාග අනුසය - වස්තු කාම - ක්ලේශ කාමය
ii. පටිඝ අනුසය - ද්වේශය හෙවත් තරහව
iii. මාන අනුසය - තමා පමණක් උසස්ය යන හැඟීම
iv. දිට්ඨි - මිත්‍යා දෘෂ්ටිය
v. විචිකිච්ඡා - බුද්ධාදි අව තැන කෙරේ සැක පහළ කිරීම
vi. භවරාග අනුසය - භවය හෙවත් පැවැත්මට ආශාව
vii. අවිජ්ජා අනුසය - මැරදි වැටහීම

11 සත් අසද් ධර්ම

i. අස්සද්ධෝ - ශ්‍රද්ධාව නොමැති බව
ii. අහිරිකෝ - පාප ලැජ්ජා නැති බව
iii. අනොත්තප්පි - පාප බිය නැති බව
iv. අප්පස්සුතෝ - නූගත් බව
v. කුසීතෝ - කම්මැලි නිදාගිලි බව
vi. මුට්ඨස්සති - සිහිමුලා බව
vii. දුප්පඤ්ඤෝ - මෝඩ බව

12 සත් බෝධි පාක්ෂික ධර්ම - මෙම ධර්ම හත විස්තර වශයෙන් ගත්කල 37 කි. ඒවාට 'සත්තිස් බෝධිපාක්ෂික' ධර්ම යැයි ව්‍යවහාර කරයි එනම්-

i. සතර සතිපට්ඨාන 4
ii. සතර සම්මප්පධාන 4
iii. සතර සෘද්ධි පාද 4
iv. පංච ඉන්ද්‍රිය 5
v. පංච බල 5
vi. සප්ත බොජ්ඣංග 7
vii. ආර්ය අෂ්ටාංගික මාර්ගය 8

37

13 සප්ත දුශ්චරිත (දුසිරිත්)

i. ප්‍රාණාතිපාත - පරපණ නැසීම
ii. අදත්තාදාන - අන්සතු දෙය සොරකම
iii. කාමේසු මිච්ඡාචාරා - කාමයෙහි වරදවා හැසිරීම } කයෙන්
iv. මුසාවාද - බොරු කීම
v. පිසුනාවාචා - කේලාම් කීම
vi. ඵරුසාවාචා - පරුෂ වදන් කීම
vii. සම්ඵප්පලාපා - හිස් වදන් කීම } වචනයෙන්

14 සප්ත සංඥා

i. අසුභ සංඥා - අසුභ නිමිති පිළිබඳ දැනීම
ii. මරණ සංඥා - මරණය පිළිබඳ දැනීම
iii. ආහාර පටික්කූල සංඥා - ආහාරයේ පිළිකුල බව දැනීම

iv. සබ්බලෝකේ අනභිරත සංඥා - ලෝකයෙහි නොඇලීම
v. අනිච්ච සංඥා - තිලකුණු (අනිත්‍ය - දුක - අනාත්ම) පිළිබඳ දැනීම
vi. අනිච්චේ දුක්ඛ - අනිත්‍ය හා දුක පිළිබඳ
vii. දුක්ඛ අනත්ත - දුක අනන්ත වූ කෙලවර නොදත් බව

15 බෝ සතුන් සමග පහලවූ අනෙක් දෑ

i. බෝධි වෘක්ෂය
ii. යසොදරා දේවිය
iii. ඡන්න ඇමති
iv. කන්ථක අශ්වයා
v. කළුදායි ඇමති
vi. සතර මහා නිධානය

16 චක්‍රවර්ති (සක්විති රජු) හට අයත් වස්තු

i. චක්‍ර - රථ
ii. හස්ථි - ඇතුන්
iii. අස්ස - අශ්වයින්
vi. මණි - මැණික්
v. ඉත්ථි - රූමත් ස්ත්‍රීන්
vi. ගහපති - ගෘහපතියන්
vii. පරිනායක - පුත්‍රයන්

17 සත් පුරුෂ ගුණ (යහපත් ධර්මතා හත)

i. ශ්‍රද්ධාව - ත්‍රිවිධ රත්නය කෙරෙහි අචල භක්තිය
ii. හිරි - පව් කිරීමට ඇති ලැජ්ජාව
iii. ඔත්තප්ප - පව් කිරීමට ඇති බිය
iv. බහුශ්‍රැත බව - බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව
v. ආරද්ධ වීර්යය - යම් කටයුත්තක් ආරම්භයේ පටන් නොපසුබට උත්සාහය
vi. සති - මනාලෙස හසුරුවා ගත් සිහිය
vii. පඤ්ඤා - නුවණැති බව

සප්ත අපරිහානීය ධර්ම (වජ්ජීන්ගේ දියුණුවට හේතු විය)

i. නිතර සමගියෙන රැස්ව සමගියෙන් විසිර යාම
ii. සමගියෙන් යුතුව සියළු කටයුතුවල යෙදීම
iii. පැරණි ධර්මයන් පිළිගෙන ඒවාට ගරු කිරීම
iv. වැඩිහිටි ගෞරවය
v. ස්ත්‍රීන් බලයෙන් තම වසඟයට නොගැනීම
vi. පූජනීය ස්ථානවලට ගරු කිරීම (සියළු ආගම් වල)
vii. රහතන්වහන්සේලා ආරක්ෂා කරමින් පෝෂණය කිරීම

සප්ත විසුද්ධි(පිරිසිදු වීම)

i. සීල විසුද්ධි චතුපාරිශුද්ධ සීලය
ii. චිත්ත විසුද්ධි - භාවනා - ධ්‍යාන මගින් සිතේ පිරිසිදු බව
iii. දිට්ඨි විසුද්ධි ආත්මය පිළිබඳ මිත්‍යා දෘෂ්ඨිය නොමැතිවීම
iv. කංඛා විතරණ විසුද්ධි - තමා තුළ ඇති සැක දුරුකර ලීම
v. මග්ගා මග්ග ඥාණ දස්සන විසුද්ධි - අනුගමනය කළ යුතු මාර්ගයන් පිළිබඳ දැකීම හා දැනීම
vi. පටිපදා ඥාණ දස්සන විසුද්ධි විමුක්තිය සොයා යන ගමනේ තම වර්ධනය පිළිබඳ දැකීම
vii. ඥාණ දස්සන විසුද්ධි ලෝකෝත්තර මාර්ගය දැකීම හා එමගින් සිත පිරිසිදු කර ගැනීම

අෂ්ට හෙවත් අට බැගින්

1 අෂ්ටලෝක ධර්ම (අටලෝ දහම්)

i. ලාභෝ - ලාභය
ii. අලාභෝ - අලාභය
iii. අයසෝ - අපකීර්තිය
iv. යසෝච - යසස හෙවත් කීර්තිය
v. නින්දා - නින්දාවට පත්කිරීම - නිග්‍රහ කිරීම
vi. පසංසා - පැසසුමට ලක් කිරීම
vii. සුඛං - සැප සම්පත්
viii. දුක්ඛං - දුක් වේදනා

2 අට වැදෑරුම් කෙලෙස්

i. ලෝභ - ලෝභ හෙවත් මසුරු බව
ii. දෝස - තරහව හෙවත් ක්‍රෝධය
iii. මෝහ - සිහිමුලා වීම
iv. දිට්ඨි - මිත්‍යා දෘෂ්ඨි හෙවත් වැරදි දැක්ම
v. විචිකිච්ඡා - බුද්ධාදී අටතැන කෙරේ සැක සංකා
vi. මාන - තමා පමණක් තම කුලය පමණක් උසස්ය හැගීම
vii. ථීන - සිතේ අකර්මන්‍ය හෙවත් කුසීත බව
viii. උද්ධච්ච - සිතිවිලි විසිරී පැවතීම

3 අෂ්ට සමාපත්ති

i. ප්‍රථම ධ්‍යානය
ii. ද්විතිය ධ්‍යානය
iii. තෘතිය ධ්‍යානය
iv. චතුර්ථ ධ්‍යානය
v. ආකාසානඤ්චායතනය
vi. විඤ්ඤාණඤ්චායතනය
vii. ආකිඤ්චඤ්ඤායතනය
viii. නේවසඤ්ඤානාසඤ්ඤායතනය

ආර්ය අෂ්ඨාංගික මාර්ගය

i. සම්මා දිට්ඨි - යහපත් දැකීම - හෙවත් චතුරාර්ය සත්‍යය දැකීම

ii. සම්මා සංකප්ප - යහපත් කල්පනා - ලෞකික සම්පත් වලින් නික්මීම ආදී කල්පනා

iii. සම්මා වාචා - යහපත් වචනය හෙවත් වචනයෙන් සිදුවන අකුසල වලින් වැලකීම

iv. සම්මා කම්මන්ත - යහපත් කර්මාන්ත හෙවත් පානාතිපාතා වැනි කයෙන් සිදුවන වැරදි වලින් තොරවීම

v. සම්මා ආජීව - යහපත් දිවි පෙවෙත හෙවත් වැරදි වෙළඳාම් පහෙන් තොරවීම

vi. සම්මා වායාම - හෙවත් යහපත් වැයම නූපන් කුසල් උපදවා ගැනීම ආදී යහපත් වැයම

vii. සම්මා සති - යහපත් සිහිය හෙවත් කයෙහි ස්වභාවය පිළිබඳ කායානුපස්සනාදී සතර සතිපට්ඨාන වැඩීම

viii. සම්මා සමාධි - යහපත්වූ චිත්ත ඒකග්‍රතාව හෙවත් ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන උපදවා ගැනීම

අටමහා නරකය

i. සංජීවය
ii. කාල සූත්‍රය
iii. සංඝාතය
iv. රෞරවය
v. මහා රෞරවය
vi. තාපය
vii. ප්‍රතාපය
viii. අවීචිය

භික්ෂුණීන් වහන්සේලා පිළිපැදිය යුතු අෂ්ඨ ගරු ධර්ම

i. උපසම්පදාවෙන් වසර100ක් ගතවූ භික්ෂුණියක් වුවද එදින උපසම්පදා වූ භික්ෂුවකට වැඳිය යුතුය.

ii. අඩ මසකට වරක් භික්ෂූන් හමුවී උපෝසතය විසීම හා අවවාද ලැබිය යුතුය.

iii. තමන් ඇසූ දුටු දේ පිළිබඳව විමසා බැලීමට භික්ෂූන් වහන්සේ කෙනෙකුට පැවරිය යුතුය.

iv. භික්ෂුණිය වරදක් හෙවත් ඇවැතක් කළ විට එයින් මිදී ගැලවී පිරිසිදු වීමට භික්ෂුවකට අඩ මසක්වත් පිළිවෙත් කළ යුතුය.
v. භික්ෂුවක් වෙතින් උපසම්පදා පැතිය යුතුය.
vi. කවර ආකාරයකින් වුවද භික්ෂුණිය භික්ෂුවකට නින්දා අපහාස ආක්‍රෝශ පරිභව නොකළ යුතුය.
vii. භික්ෂුවකගේ අවවාද අනුශාසනා වලට අනුකූලතාවය දැක්විය යුතුය.

අෂ්ටාංග සීලය හෙවත් අටසිල්

i. පාණාති පාතා වේරමණී සික්ඛා පදං
ii. අදින්නාදානා වේරමණී සික්ඛා පදං
iii. අබ්‍රහ්ම චරියා වේරමණී සික්ඛා පදං
iv. මුසාවාදා වේරමණී සික්ඛා පදං
v. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛා පදං
vi. විකාල භෝජනා වේරමණී සික්ඛා පදං
vii. නච්ච - ගීත - වාදිත විසූක දස්සන - මාලා ගන්ධ විලේපන - ධාරන - මණ්ඩන විභූසනට්ඨාන වේරමණී සික්ඛා පදං
viii. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං

8 අට පාන
i. අම්බ පාන - අඹ යුෂ
ii. ජම්බු පාන - දඹ යුෂ
iii. චොච පාන - ඇටකෙසෙල් යුෂ
iv. මොච පාන - කෙසෙල් යුෂ
v. මධුකා - මීයුෂ
vi. මුද්දික පාන - මිදි පැණි
vii. සාලුක පාන - ඕලු යුෂ
viii. ඵාරුසක පාන - ඵලු හෙවත් උගුරැස යුෂ

9 අෂ්ට ආබාධ (අට වැදෑරුම් රෝග)
i. පිත්ත සමුට්ඨාන - පිත කිපීමෙන් ඇතිවන ආබාධයන්
ii. සෙම්හ සමුට්ඨාන - සෙම් කෝපයෙන් ඇතිවන ආබාධ
iii. වාත සමුට්ඨාන - වාත කිපීමෙන් ඇතිවන ආබාධ
iv. සන්නිපාතික ආබාධ - දොස් සන්නිපාතය වැනි ආබාධ
v. උතු පරිනාමජ ආබාධ - සෘතු විපර්යාස හේතුවෙන් ඇතිව

ආබාධ

vi. විසමපරිහාරජා ආබාධා - වැරදි දිවි පෙවෙත නිසා හටගන්නා ආබාධ

vii. ඔපක්කමිකා ආබාධා - නොයෙක් කුට උපක්‍රම වලින් හට ගන්නා ආබාධ

viii. කම්ම විපාකජා ආබාධ - පෙර භවයන්හි හෝ මෙම භවයේදී කරන ලද්දා වූ අකුසල්වල විපාක අනුව ඇතිවන ආබාධා

බෝසතුනට අවශ්‍ය ධර්මතා

i. මිනිසෙකු වීම
ii. පිරිමියෙකු වීම
iii. ඒ ආත්මයේදීම රහත් වීමට හේතු සම්පත් ඇති බව
iv. බුදු කෙනෙකු මුන ගැසීම
v. පැවිදි වී සිටීම
vi. උසස් ගුණධර්මවලින් පිරිපුන් බව
vii. දැඩිවූ අධිෂ්ඨානය (අධිකාර)
viii. කැමැත්ත තිබීම

විචිකිච්ඡා හෙවත් බුද්ධාදි අට තැන කෙරෙහි ඇති සැකයන්

i. සත්ථරි කංඛති - බුදුන කෙරෙහි ඇති සැකය
ii. ධම්මේ කංඛති - ධර්මය කෙරෙහි ඇති සැකය
iii. සංඝෙ කංඛති - සංඝයා කෙරෙහි ඇති සැකය
iv. සික්ඛාය කංඛති - ශික්ෂාපද කෙරෙහි ඇති සැකය
v. පුබ්බන්තෙ කංඛති - අතීත හෙවත් පෙර භවය පිළිබඳ සැකය
vi. අපරන්තෙ කංඛති - මරණින් මතු භවය පිළිබඳ සැකය
vii. පුබ්බා පරන්තෙ කංඛති - පෙර හා මතු භවයන් පිළිබඳ සැකය
viii. ඉදප්පච්චයතා කංඛති - පටිච්ච සමුප්පාදය හා හේතුඵල වාදය පිළිබඳ සැකය

12 අෂ්ඨ පරික්ඛාර (අට පිරිකර)

i. තනිපට සිවුර
ii. දෙපට සිවුර
iii. අඳනය
iv. පාත්‍රය
v. බඳපටිය
vi. දැලි පිහිය
vii. පෙරහන් කඩ
viii. ඉඳිකටු - නූල්

13 ධම්ම භාණ්ඩාගාරික ආනන්ද මහ තෙරන් වහන්සේ එම තනතුරු ලබා දීමට පෙර බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි කරුණු අට (වර)

i. බුදුන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය තමන් වහන්සේට නොදීම
ii. බුදුන් වහන්සේට ලැබෙන පරිශ්කාර (පිරිකර) තමන් වහන්සේට නොදීම
iii. බුදුන් වහන්සේ සමග එකම ගඳ කිලියෙහි විසීමට ඉඩ නොදීම
iv. බුදුන් වහන්සේ භාරගත් දාන ආරාධනා වලට තමන් වහන්සේ නොකැඳ වීම
v. තමන් වහන්සේ භාරගත් දාන ආරාධනාවලට බුදුන් වහන්සේද වැඩම කළ යුතුය
vi. බොහෝ දුරක සිට පැමිණෙන සැදැහැවතුන් ඒ මොහොතේම බුදුන් වහන්සේ සමීපයට කැඳවා ගෙන ඒමට අවසර තිබීම
vii. තමන් වහන්සේට ධර්මය පිළිබඳ යම් ගැටළුවක් සැකයක් ඇති වුවහොත් වහාම එය විසඳා ගැනීමට බුදුරජුන් හමුවට යාමට අවසර තිබීම
viii. තමන් වහන්සේ නොමැති අවස්ථාවක බුදුන් වහන්සේ යමෙක් හට දේශනා කළ ධර්ම කොටසක් වෙතොත් එය නැවත තමන්ටද දේශනා කිරීම

අෂ්ට විද්‍යා (බුදුරජාණන් වහන්සේ සතු ඥාණ)

i. විදර්ශනා ඥාන - විදර්ශණා භාවනාව මගින් ඇතිවූ නුවණ
ii. මනෝමය ඥාන - අධිෂ්ඨාන බලෙන් ඍද්ධි ප්‍රාතිහාර්ය පෑම
iii. ඍද්ධි විධ ඥාන - අහසින් යාම - පොලව පලාගෙන යාම වැනි පුදුම උපදවන දේ කල හැකි නුවණ
iv. දිබ්බසෝත - දිව කන හෙවත් සියලූ ලෝකයන්හි සියලූ ශබ්ද ඇසීම

v. පරචිත්ත විජානන ඥානය - තමන් වහන්සේ සමීපයේ හෝ දුර ඈතක සිටින අයෙකුගේ වුවද සිතුවිලි දක්නා නුවණ
vi. පුබ්බෙනිවාසානුස්සති - පෙර ආත්ම භවයන්හි තොරතුරු දන්නා නුවණ
vii. දිබ්බ චක්ඛු - දිව කන හෙවත් ලොව ඕනෑම තැනක හට ගන්නා කුමන ශබ්දයක් වුවද දත හැකි නුවණ
viii. ආසවක්ඛය ඥාණය - ආශ්‍රවයන් හෙවත් සසර කෙරෙහි ඇලීම් - බැඳීම - පල්වීම් නොවීමේ ඥාණය

අෂ්ඨවිධ ශීල - සිල් අට වර්ගය

i. පංච ශීල
ii. අෂ්ඨාංග ශීල - අටසිල්
iii. දශ ශීල - දස සිල්
iv. ප්‍රව්‍රජ්‍යා ශීල - පැවිදි සිල්
v. ප්‍රාතිමෝක්ෂ සංවර ශීල
vi. ඉන්ද්‍රිය සංවර ශීල
vii. ආජීව පාරිශුද්ධි ශීල
viii. ප්‍රත්‍යය සංනිශ්‍රිත ශීල

16 චතුරාර්ය සත්‍යයේ පළමු සත්‍යය දුඃඛ සත්‍යයට අනුව දුක හටගන්නා හේතු

i. ජාතිපි දුක්ඛා - ජාතිය හෙවත් ඉපදීම දුකය

ii. ජරාපි දුක්ඛා - දිරායාම හෙවත් වයස්ගත වීම දුකය

iii. ව්‍යාධිපි දුක්ඛා - ලෙඩදුක් සෑදීම දුකය

vi. මරණම්පි දුක්ඛා - මරණයට පත්වීම දුකය

v. අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ - අප්‍රියයන් හා එක්වීම දුකය

vi. පියේහි විපපයොගො දුක්ඛෝ - ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකය

vii. යම්පිච්ඡං න ලහති තම්පි දුක්ඛං - තමන් කැමති දෙය නොලැබීම දුකය

viii. සංඛිත්ටේන පංච උපාදනක්ඛන්ධා දුක්ඛා - සැකවින් කියතහොත් පංච උපාදනස්කන්ධයන් සියල්ලම දුකය

17 අටමහා කුසල්

i කඨින පුජාව

ii අටපිරිකර පුජාව

iii ආවාස පුජාව

iv බුදුන් ප්‍රමුඛ දානය

v ධර්මය ලියා තැබීම

vi ඉඩම් පුජාව

vii බුද්ධ ප්‍රතිමා තැනීම

viii වැසිකිළි කැසිකිළි තනා දීම

නවක හෙවත් නවය බැගින් වූ කරුණු

නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය (නව ලොව්තුරා දහම)

i. සෝවාන් මග
ii. සෝවාන් ඵලය
iii. සකෘදගාමී මග
iv. සකෘදගාමී ඵලය
v. අනාගාමී මග
vi. අනාගාමී ඵලය
vii. අර්හත් මග
viii. අර්හත් ඵලය
ix. නිර්වාණය

නව අරහාදී බුදු ගුණ (ඉතිපිසො භගවා ගාථාව)

i. අරහං - රහසින්වත් පව් නොකොට සියලු කෙළෙස් දුරුකර දෙව් මිනිසුන්ගේ සියලු පූජාවන්ට සුදුසු බැවිනි

ii. සම්මා සම්බුද්ධ - කිසිවෙකුගේ මග පෙන්වීමක් නොමැතිව තමා විසින්ම චතුරාර්‍ය සත්‍ය අවබෝධ කළ බැවින්

iii. විජ්ජාචරණ සම්පන්න - අෂ්ඨ විද්‍යා ඥාන හා පසලොස්චරන ගුණයෙන් යුතු බැවින්

iv. සුගතෝ - ශෝභමාන වූ ගමන් විලාසයද ඇතිව විමුක්තිය කරා යාම හේතුවෙන්

v. ලෝකවිදූ - සියලු ලෝකයද චතුරාර්‍ය සත්‍යද අතැඹුලක් සේ දත් බැවින්

vi. අනුත්තරෝ - ගුණයෙන්ද නුවණින්ද ලොව කිසිවෙකුට සමාන කළ නොහැකි බැවින්

පුරිස දම්ම සාරථි - මිනිසුන්ද දෙව් බඹුන් මෙන්ම යක්ෂයින්ද එකසේ දමනය කළ බැවින්

vii. සත්ථා දේව මනුස්සානං - දෙව් බමුන්ටද මිනිසුන්ටද විමුක්තිය ලබා දුන් බැවින්

vii. බුද්ධෝ - දත යුතු සියල්ල දත් බැවින්

ix. භගවා - මහත් වූ පින් ඇති බැවින්

3 නව දොරටු : අපවිත්‍රදේ පිටකරන ශරීරයේ දොරටු 9

i. දෙකන් සිදුරු 2
ii. දෙ ඇස් 2
iii. නාස් සිදුරු 2
iv. මුඛය 1
v. මුත්‍රා මාර්ගය 1
vi. ගුද මාර්ගය 1

4 රහත් ඵලය ලැබීමට දුරුකළ යුතු නවාංග

i. රාගං - රාගය හෙවත් දැඩි ආශාව
ii. දෝසං - ද්වේශය හෙවත් තරහව
iii. මෝහ - මෝහය හෙවත් තරහව
iv. මක්ඛං - ගුණමකු කුහක බව
v. කෝධං - ක්‍රෝධ හෙවත් වෛරය
vi. උපනාහං - දූෂ්‍ය හෙවත් පවිටු බව
vii. පලාසං - කුඩුකේඩු මසුරු බව
viii. ඉස්සං - ඊර්ශ්‍යාව
ix. මච්ඡරියං - මාත්සර්යය හෙවත් උඩඟු බව

5 සංඝයා වහන්සේලාගේ ගුණ නවය

i. සුපටිපන්න - යහපත් මාර්ගයට මනාව පිළිගත් බට
ii. උජුපටිපන්න - සෘජුව එම මාර්ගය අනුගමනය කරන බැවින්
iii. ඤායපටිපන්න - නුවණින් මනාව අවබෝධ කර අර්හත් මාර්ගයට පිළිපන් බැවින්
iv. සාමීචිපටිපන්න - සදාචාර ගුන වගාවට පිළිපන් බැවින්
v. ආහුණෙය්‍ය - සිව් පසය පිළිගැනීමට සුදුසු බැවින්
vi. පාහුණෙය්‍ය - දුර සිට ගෙනවුත් දෙන දේ පිළිගැනීමට සුදුසු බැවින්
vii. දක්ඛිණෙය්‍ය - දානාදිය පිළිගැන්වීමට සුදුසු වන බැවින්
viii. අඤ්ජලිකරණීය - ඇඳිලි බැඳ නමස්කාර කිරීමට සුදුසු බැවින්
ix. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති - ලෝකයට ශ්‍රේෂ්ඨ වූද දෙවැනි නොවූද පින්කෙතයි

නවාංග ශාස්තෘ ශාසනය

i. සුත්තං - බුදුන් වහන්සේ දේශනාවන් ගැබ්වූ ගද්‍යාත්මක සූත්‍ර
ii. වෙය්‍යාකරණ - ගද්‍ය විවරණයන්
iii. ගාථා - ගාථා ධර්මයන්
iv. ඉතිවුත්තකං - මෙලෙස වදාළ බැව් ප්‍රකාශිත සූත්‍ර
v. උදාන - උදාන වාක්‍ය
vi. ජාතක - පන්සිය පනහකට ආසන්න ජාතක කතා
vii. අබ්භූත ධම්ම - ආශ්චර්යවත් දහම් කරුණු
viii. වේදල්ල - ප්‍රශ්න හා උත්තර ඇතුළු සූත්‍ර
ix. ගෙය්‍යං - ගාථා සහිත සූත්‍ර

නවවිධ පිළිකුල් භාවනා

i. සොහොන් බිමක දමාගිය දින කිහිපයක් ගතවී ඉදිමී නිල්
පැහැවූ මළ මිනිය
ii. කාකයන් විසින් හා සිවලුන් විසින් කා දමන මළ මිනිය
iii. නහරින් බැඳී ඇති ලේ - මස් සහිත මළ මිනිය
iv. මස් රහිත ලෙයින් වැකුන නහරින් බැඳුන මළ මිනිය
v. ලේ මස රහිත නහරින් බැඳුන මළ මිනිය
vi. සන්ධි වලින් විසන්ධි වූ ඇට සහිත මළ මිනිය
vii. සංඛය හෙවත් හක්ගෙඩියක පාට බඳු ඇට සැකිල්ල
viii. දිරායන ඇට සැකිල්ල

පුද්ගල මල නවය (පුද්ගල දියුණුවට බාධාකරන කිලිටි කරන කරුණු)

i. කෝධෝ - ක්‍රෝධය
ii. මක්ඛෝ - කුහකවට
iii. ඉස්සා - ඊර්ෂ්‍යාව
iv. මච්ඡරියං - මසුරු ලෝභ

v. මායා - රවටන සුළු බව

vi. සාඨෙය්‍යං - කපටි කම

vii. මුසාවාදෝ - බොරුකීම

viii. පාපිච්ඡා - පවිටු ආශා ඇති බව

ix. මිච්ඡාදිට්ඨි - මිසදිටු බව

9 නවවිධ පුද්ගල උත්පත්ත

i කාම භව - සදෙව් ලොවද මිනිස් ලොවද සතර අපාය

ii රූප භව - බ්‍රහ්ම ලෝක - 16

ii අරූප භව - අරූපී බ්‍රහ්ම ලෝක 4

iii සඤ්ඤා භව - කාම ලෝක 11ද රූප ලෝක 15ද අරූපී 3

iv අසඤ්ඤා භව - අසඤ්ඤ සත්තය- 1

v නේවසඤ්ඤානාසඤ්ඤායතනය - මෙනම් බ්‍රහ්ම ලෝකයකි

vi ඒක වෝහාර - අසඤ්ඤ සත්තය (රූපය පමණි)

vii චතු වෝහාර - අරූපී බ්‍රහ්ම ලෝක 4

viii පඤ්ච වෝහාර - කාම භව හා අසඤ්ඤ සත්තය හැර ඉතිරි බ්‍රහ්ම ගෝක 15

දශක හෙවත් කරුණු දහය බැගින්

දස සීල - දස සිල්

i. පානාතිපාතා වේරමණී - පරපණ නැසීමෙන් වැළකෙමි

ii. අදින්නාදානා වේරමණී - අන්සතු දේ සොරා ගැනීමෙන් වළකිමි

iii. අබ්‍රහ්මචරියා වේරමණී - මෙවුන්දම් සේවනයෙන් වැළකෙමි

iv. මුසාවාදා වේරමණී - බොරුකීමෙන් වැළකෙමි

v. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී - මත් වීමට හා ප්‍රමාදයට හේතුවන සුරාවෙන් වැළකෙමි

vi. විකාලභෝජනා වේරමණී - අවේලාවන්හිදී ආහාර ගැනීමෙන් වැලකෙමි

vii. නච්චගීත වාදිත විසුක දස්සන - නැටුම් - ගැයුම් - වැයුම් -විසුළු දැකුමෙන් වැළකෙමි

viii. මාලා සන්ධ විලේපන ධාරන මණ්ඩන විභූසනට්ඨානා වේරමණී - මල් සුවඳ විලවුන් ගැල්වීමෙන්ද පැළඳීම් හා සැරසිලි වලින් වැළකෙමි

ix. උච්චාසයන මහා සයනා වේරමණී - උස්වූද මහත්වූද අසුන් වල හිඳීමෙන් වැළකෙමි

x. ජාතරූප රජත පටිග්ගහනා වේරමණී - රන් රිදී මිල මුදල් පිළිගැනීමෙන් වැළකෙමි

දස අකුසල්

i. පානාතිපාතා - පරපන නැසීමෙන්

ii. අදින්නාදාන - අන්සතු දේ සොරා ගැනීමෙන්

iii. කාමේසු මිච්ඡාචාරා - කාමයෙහි වරදවා හැසිරීමෙන්

iv. මුසාවාදා - බොරු කීමෙන්

v. පිසුනාවාචා - කේලාම් කීමෙන්

vi. ඵරුසා වාචා - පරුෂ රළු වදන් කීමෙන්

vii. සම්ඵප්පලාපා - හිස් වදන් කීමෙන්

viii. අභිජ්ඣා - දැඩි ලෝභයෙන්

ix. ව්‍යාපාද - ක්‍රෝධය වෛරයෙන්

x. මිච්ඡාදිට්ඨී - විසදිටු හෙවත් මෙලොව පරලොව නැතැයි විශ්වාසයෙන්

3 දස අනුස්සති (සිහි කිරීම මගින් සිත එකඟකර ගැනීම)

i. බුද්ධානුස්සති - බුදුන් වහන්සේ සිහිකිරීම
ii. ධම්මානුස්සති - ධර්මය සිහිකිරීම
iii. සංඝානුස්සති - සංඝයා සිහිකිරීම
iv. සීලානුස්සති - ශීලය පිළිබඳ සිහිකිරීම
v. චාගානුස්සති - තමන්ගේ ත්‍යාගශීලි භාවය සිහිකිරීම
vi. දේවතානුස්සති - දෙවියන් පිළිබඳ සිහිකිරීම
vii. මරණානුස්සති - මරණය පිළිබඳ සිහිකිරීම
viii. කායානුසසති - ශරීරය පිළිබඳ සිහිකිරීම
ix. ආනාපානානුස්සති - හුස්ම ඉහල පහල යාම් ඊම් පිළිබඳ සිහිකිරීම
x. උපසමානුසසති - සංසුන් හෙවත් සිතෙහි ඒකග්‍රතාව පිළිබඳ සිහිකිරීම

4 දස විධ ක්ලේශ (කෙලෙස් දහය) අකුසල මූල

i. ලෝභෝ - දැඩි ලෝභය හෙවත් මසුරු බව
ii. දෝසෝ - ද්වේෂය හෙවත් තරහව - ක්‍රෝධය
iii. මෝහෝ - සිහි මුලාව හෙවත් මෝහය
iv. මානෝ - මානය හෙවත් තමන් පමණක් හා තම වස්තුව කුලය පමණක් උසස්ය යන හැගීම
v. දිට්ඨි - මිත්‍යා දෘෂ්ඨිය හෙවත් වැරදි දැක්ම
vi. විචිකිච්ඡා - බුද්ධාදි අට තැන කෙරෙහි සැකය
vii. ථීනං - කුසල් කිරීමට කම්මැලි කුසීත බව
viii. උද්ධච්ච - සිත නිතරම විසිරී පැවතීම
ix. අහිරිකං - පව් කිරීමට ලජ්ජා නැති බව
x. අනොත්තප්පං - පව් කිරීමට බිය නැති බව

5 දස කසින (භාවනා සඳහා උපයෝගී කරගන්නා දස නිමිති)

i. පඨවි කසින - තද බැවින් යුත් නිමිති
ii. ආපෝ කසින - වැගිරෙන දියර වැනි ගති ඇති නිමිති
iii. තේජෝ කසින - ශීත - උෂ්ණ දියෙන් යුත් කසින
iv. වායෝ කසින - වායුමය ගති (සුළඟ වැනි) කසින නමිනි
v. නීල කසින - නිල් පැහැ නිමිති
vi. පීත කසින - කහ පැහැමයෙන් යුත් නමිනි

vii. ලෝහිත කසින - රතු පැහැයෙන් යුත් නමිති
viii. ඔදාත කසින - සුදු පැහැයෙන් යුත් නමිති
ix. ආලෝක කසින - ඉර - හඳ - පහන් වැනි දේ නිමිති කර
x. පරිච්ඡින්න - ආකාසය නිමිති ලෙස උපයෝගී කර

දස දාන වස්තු (දානය පිණිස දෙන වර්ග)

i. අන්නං - ආහාර වර්ග
ii. පානං - පානයට සුදුසු දේ
iii. සරං - ආවාස - සෙනසුන් - ලැගුම් හල් වැනි දේ
iv. වත්තං - සිවුරු පිරිකර
v. යානං - යාන වාහන
vi. මාලා - මල් වර්ග
vii. විලේපණං - විලවුන් වර්ග
viii. ගන්ධෝ - සුවඳ වර්ග
ix. සෙය්‍යා - ඇඳ - පුටු - සෝපා ආදිය
x. පදීප - පහන්

දස සඤ්ඤා (භාවනාවේ අරමුණු)

i. අනිච්ච සඤ්ඤා - සියල්ලෙහි අනිත්‍ය බව මෙනෙහි කිරීම
ii. අනත්ත සඤ්ඤා - අනාත්ම බව මෙනෙහි කිරීම
iii. මරණ සඤ්ඤා - මරණය පිළිබඳ මෙනෙහි කිරීම
iv. ආහාරෙ පටික්කුල සඤ්ඤා - අහරෙහි පිළිකුල් බව මෙනෙහි කිරීම
v. සබ්බලෝකෙ අනභිරත සඤ්ඤා - ලොවැනි කිසිදු දෙයක් කෙරෙහි නොඇලීම
vi. අට්ඨික සඤ්ඤා - ඇට සැකිල්ලක් වූ මළ මිනිය ගැන මෙනෙහි කිරීම
vii. පුලවක සඤ්ඤා - පණුවන් ගැසු මළ මිනිය ගැන මෙනෙහි කිරීම
viii. විනීලක සඤ්ඤා - නිල්පැහැවූ මළ මිනිය ගැන මෙනෙහි කිරීම
ix. විච්ඡිද්දක සඤ්ඤා - සිදුරු සැදීගිය මළ මිනිය ගැන මෙනෙහි කිරීම
x. උද්ධුමාතක සඤ්ඤා - ඉදිමුණ මළ සිරුර ගැන මෙනෙහි කිරීම

8 දස මාර සේනා (දස මරුන්)

i. කාම කාමාශාවන්
ii. අරති නොඇල්මීමත් බව
iii. ඛුප්පිපාසා කුසගින්න හා පිපාසය
iv. තණ්හා තෘෂ්ණා හෙවත් ඇලී ගැලී සිටීම
v. ථීන මිද්ධ අලස කුසීත බව
vi. භීරු බියගුළු බව
vii. විචිකිච්ඡා සැක පහල කිරීම
viii. මක්ඛෝ දැඩි ගුණමකු බව
ix. ථම්භෝ දැඩි බව
x. ලාභෝ සිලෝකෝ ලාභය ප්‍රසංශා

9 දස පුණ්‍යක්‍රියා (දස පින් කිරියවත්)

i. දාන - තමන් සතුදේ නිර්ලෝභීව දානය කිරීම
ii. ශීල - පන්සිල් - අටසිල් ආදිය ආරක්ෂා කිරීම
iii. භාවනා - සමථ - විපස්සනාදී භාවනා
iv. පත්තිදාන - කුසලයන්ගෙන් අත්පත් වූ පින් අනුමෝදන් කිරීම
v. පත්තානුමෝදනා - අන්අය දෙන පින් අනුමෝදන් වීම
vi. වෙය්‍යාවච්ච - රෝගීන්ට - වැඩිහිටියනට උපස්ථාන කිරීම
vii. අපචායනය - ගුණ - නුවණ යුත් අයට බුහුමන් කිරීම
viii. ධම්ම දේශනා - ධර්මය දේශණා කිරීම
ix. ධම්ම සවණ - ධර්මය ශ්‍රවණය කිරීම
x. දිට්ඨිජු කම්ම - තිසරණ පිළිබඳ නිවැරදි දැක්ම

10 දස අකැප වස්තු (බුදුන් වහන්සේ පිරිනිවන් පෑ පසුව සුභද්‍ර නම් මහළු භික්ෂුව ඉදිරිපත් කල භික්ෂුනට කැප නැති දස වස්තුව)

i. ද්වාංගුල කප්ප - හිරු අවරට ගොස් දෑගුලක් ගතවන තුරු ආහාර අනුභවය කැපය
ii. සිංගිලෝන කප්ප - අවශ්‍ය විටෙක පරිභෝජනය පිණිස අං කොපුවක බහා ලුණු ගෙනයාම කැපය
iii. ගාමාන්තර කප්ප - ගමින් ගමට ගොස් දානය ලබා ගැනීම කැපය
iv. ආවාස කප්ප - එකම ආවාසයක පෙහොය කිරීම කැපය
v. අනුමති කප්ප - සංඝ කර්මයන් නිමාකොට පසුව ඒ සඳහා

අනුමැතිය ලබාගැනීම කැපය

vi. ආචින්න කප්ප - පූර්වාදර්ශ අනුව පිළිගැනීම කැපය

vii. අමථිත කප්ප - දිවා ආහාරයට පසුව මෝරු පානය කිරීම කැපය

viii. ජලෝගිපාතුං කප්ප - මද්‍යසාරයට පත්වීමට පෙර රා හෙවත් තෙලිජ්ජ පානය කැපය

ix. අදසක නිසීදන කප්ප - ඇඳ ඇතිරිලි භාවිතය කැපය

x. ජාතරූප පටිග්ගහනා කප්ප - රන් - රිදී - මුතු -මැණික් ආදී ඉතා වටිනා දේ පිළිගැනීම කැපය

දස රාජධර්ම

i. දානං - තමන් සතු දේ නිර්ලෝභීව දානය කිරීම

ii. සීලං - ශීලයක් ආරක්ෂා කිරීම

iii. පරිච්චාගං - පරිත්‍යාගය

iv. අජ්ජවං - ඍජු බව

v. මජ්ජවං - මෘදු බව

vi. තපං - තපස

vii. අක්කෝධෝ - ක්‍රෝධ නොකිරීම

viii. අවිහිංසා - හිංසා පීඩා නොකිරීම

ix. ඛන්ති - ක්ෂාන්ති වාදී බව

x. අවිරෝධතා - විරුද්ධ නොවීම

දස වත්ථුක මිථ්‍යා දෘෂ්ටී

i. නත්ථි දින්නං - දන්දීමෙන් පල නැත

ii. නත්ථි යිට්ඨං - යාග පල නැත

iii. නත්ථි හුතං - පූජාවන් පල නැත

iv. නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකෝ - කුසල් අකුසල් කර්මවල විපාක නැත

v. නත්ථි අයං ලෝකෝ - මෙලොව නැත

vi. නත්ථි පරලෝකෝ - පරලොවක් නැත

vii. නත්ථි මාතා - මවක් නැත

viii. නත්ථි පිතා - පියෙක් නැත

ix. නත්ථි සත්තා ඕපපාතික - ඕපපාතිකව පහල වන සත්ත්වයන් නැත

x. නත්ථි ලෝකෝ සමණ බ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා - මනාලෙස ආර්ය මගට පිළිපන් ශ්‍රමණ බ්‍රාහ්මණයින් නැත

13 දස සංයෝජන (පුද්ගල සසරෙහි බැඳ තබන)

i. සක්කාය දිට්ඨි - ආත්මයක් ඇතැයි පිළිගැනීම

ii. විචිකිච්ඡා -බුදුන් ඇතුළු අට තැන කෙරෙහි සැකය

iii. සීලබ්බත පරාමාස - වැරදි ශීලයන් සමාදන් වීම

iv. කාමරාගා - පංචකාමයෙන් කෙරේ ආශාව

v. ව්‍යාපාද - තරහව - ක්‍රෝධ කිරීම

vi. රූප රාග - රූපී භවයන්හි ඉපදීමේ ආශාව

vii. අරූප රාග - අරූපී භවයන්හි ඉපදීමේ ආශාව

viii. මානෝ - තමා පමණක් උසස්ය යන හැඟීම

ix. උද්ධච්ච - උඩඟු බව (සිත එක අරමුණක නොපිහිටීම)

x. අවිජ්ජා - නොදැනීම (චතුරාර්‍ය සත්‍ය නොදැනීම)

14 දස අසුභ (පිළිකුල් භාවයන් සඳහා අරමුණු කර ගන්නා අපවිත්‍ර අසුභ)

i. උද්ධුමාතක - ඉදිමුණු මළ සිරුර

ii. විනීලක - නිල්පැහැගත් මළ සිරුර

iii. විපුබ්බක - තැන තැන කැඩී ගිය මළ සිරුර

iv. විච්ඡිද්දක - සන්ධි වලින් ගැලවී ගිය මළ සිරුර

v. වික්ඛායිතක - තැන තැන වලවල් සෑදුන මළ සිරුර

vi. වික්ඛිත්තක - කොටස් ඒ ඒ තැන විසිරුන මළ සිරුර

vii. හත වික්ඛිතක - සිරුරෙන් වෙන්ව කොටස් තැනින් විසිරුන මළ සිරුර

viii. ලෝහිතක - ලේ වැගිරෙන මළ සිරුර

ix. පුලවක - පණු කැල වසාගත් මළ සිරුර

x. අට්ඨික - මස් දියව ගිය ඇට සැකිල්ල

දස දශකයන් (පුද්ගලයා උපතේ සිට මරණය දක්වා ගත කරන කාල වකවානු)

i. මන්ද දසකය - ළදරු කාලය වසර 1-10 දක්වා

ii. ක්‍රීඩා දසකය - කෙළිලොල් අවදිය වසර 10 - 20 දක්වා

iii. වර්ණ දසකය - තුරුණු අවදිය වසර 20 - 30 දක්වා

iv. බල දසකය - පුෂ්ඨිමත් ශක්තිමත් අවදිය වසර 30 - 40 දක්වා

v. ප්‍රඥා දසකය - බුද්ධිය ප්‍රබල අවදිය වසර 40 -50 දක්වා

vi. හානි දසකය - ශාරීරික - මානසික පිරිහීම අවදිය වසර 50 -60 දක්වා

vii. පබ්භාර දසකය - සිරුර නැමී යන අවදිය වසර 60 -70 දක්වා

viii. වංක දසකය - සිරුර ඇදවී වක්වී යන අවදිය වසර 70 - 80 දක්වා

ix. මොමුහ දසකය - ස්මරණ මතකය නොමැති අවදිය වසර 80 -90 දක්වා

x. සයන දසකය - ඇඳක වැතිර නැගී සිටීමට බැරි අවදිය වසර 90 - 100

16 ධනංජය සිටුතුමා තම දියණිය විශාඛාව සරණ පාවා දෙන අවස්ථාවේ දුන් ඔවදන් 10

i. ඇතුලත ගිනි පිටතට නොදීම (පවුලෙහි පුද්ගලික රහස් පිටතට නොදීම)

ii. පිටත ගිනි ඇතුලට නොගැනීම (අන්‍ය පවුල් වල පුද්ගලික තොරතුරු තම ගෙතුලට නොගැනීම)

iii. දෙන්නා හට දිය යුතුය (තමනට සලකන උපකාර කරන

අයට පමණක් දීම)

iv. නොදෙන්නා හට නොදිය යුතුය (යමක් ඉල්ලාගෙන යළි ආපසු නොදෙන්නාට නොදෙන්න)

v. දෙන්නා හටද නොදෙන්නා හටද දිය යුතුය (යාචකයන් හා දිළිඳු නෑදෑයින් හට දීම)

vi. සුවසේ ගිදිය යුතුය (ස්වාමියා හා නෑදෑයින් හමුවේ තමන් වාඩිවී නොසිටිය යුතුය)

vii. සුවසේ වැළදිය යුතුය (ස්වාමියාද නැදිමයිලන්ද ආහාර ගත් පසු තමා ආහාර ගැනීම)

viii. සුවසේ සැතපිය යුතුය (ස්වාමියාද නැදි මයිලන්ද සේවක සේවිකාවන්ද නිදිගත් පසුව නින්දට යාම කළ යුතුය)

ix. ගිනි පිළිපැදිය යුතුය (ස්වාමියාට හා නැදිමයිලන්ට ගරු බුහුමන් කල යුතුය)

x. ඇතුලත දෙවියන් නැමදිය යුතුය (තම නිවසට එන ශ්‍රමණ බ්‍රාහ්මණ වැනි පූජ්‍ය පක්ෂයට දානාදිය ලබාදී බුහුමන් කල යුතුය)

17 නිගන්ඨයන්ගේ දුර්ගුණ

i. අස්සද්ධා - ත්‍රිවිධ රත්නය කෙරෙහි ශ්‍රද්ධාව නැත

ii. දුස්සීලා - සිල්වත් නොවන දුස්සීලයන් වෙති

iii. අහිරිකා - පවට ලජ්ජා නැත්තෝය

iv. අනොත්තප්පා - පවට බිය නැත්තෝය

v. අසප්පුරිස සම්භන්ති - අසත් පුරුෂ පවිටු අය හා ඇසුරු පවත්නෝය

vi. අත්තුක්කංසන පරවම්භන - තමා පමණක් උසස් කොට අන්‍යයන් පහත් කොට සලකති

vii. සන් දිට්ඨික පරාමාස ඉතා දැඩිව මත දරන්නාහ

viii. ආධානගාහි දුප්පටිස්සග්ගින දැඩිව අල්වා ගත් දෘෂ්ටීන් පහසුවෙන් අත් නොහරිති

ix. පාපිච්ඡා පවිටු ආශා ඇත්තෝය

x. මිච්ඡා දිට්ඨිකා - මිත්‍යා දෘෂ්ටීන්හි එල්බ ගත් අය වන්නෝය

බ්‍රහ්ම ලෝක

i. බ්‍රහ්ම පාරිසජ්ජය
ii. බ්‍රහ්ම පුරෝහිතය
iii. මහා බ්‍රාහ්මය
iv. පරිත්තාභ
v. අප්පමාණාභය
vi. ආභස්සරය
vii. පරිත්තසුභය
viii. අප්පමාන සුභය
ix. සුභ කිණ්ණය
x. වේහප්පලය

දස කුසල

i. පානාතිපාතා - පරපන නැසීමෙන් වැළකීම
ii. අදත්තාදානා - අන්සතු දේ සොර ගැනීමෙන් වැළකීම
iii. කාම මිච්ඡාචාරා - කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම
iv. මුසාවාදා - බොරු කීමෙන් වැළකීම
v. පිසුනාවාචා - කේලාම් කීමෙන් වැළකීම
vi. ඵරුසාවාචා - නින්දා ඵරුස වදනින් වැළකීම
vii. සම්ඵප්පලාපා - හිස් වදනින් වැළකීම
viii. අභිධ්‍යා - දැඩි ලෝභයෙන් මසුරු බවින් වැළකීම
ix. ව්‍යාපාදා - තරහ හෙවත් වෛර නොකිරීම
x. මිථ්‍යා දෘෂ්ටි - තෙරුවන් - පින්පව් - මෙලොව - පරලොව නැතැයි යන වැරදි දැකීමෙන් මිදීම

කර්තෘගේ වෙනත් කෘති

- රට උළු ගෙදර - කාව්‍ය සංග්‍රහය
- කඳුළු මල් - කාව්‍ය සංග්‍රහය
- කරදිය කඳුළු - කාව්‍ය සංග්‍රහය
- සරල දහම් දැනුම - දහම් පාසල් සඳහා
- ගියනටද මෙම භවයේදී මගඵල ලද හැකිය
- ඕඝ තරණ හෙවත් සසර සයුරින් එතෙරට
- අසනිය මල් - කාව්‍ය සංග්‍රහය

සරල දහම් දැනුම

ප්‍රථම මුද්‍රණය : 2014 දෙසැම්බර්

සරල දහම් දැනුම

රංජිත් විජේනායක

ISBN 978-955-0731-31-5

පරිගණක අක්ෂර සංයෝජනය :

මින්සර පොත් මැදුර

මුද්‍රණය :

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

ජයන්ත වීරසේකර මාවත,

මරදාන.



ප්‍රකාශනය : **මින්සර පොත් ප්‍රකාශකයෝ**

අංක 80, බෞද්ධාලෝක මාවත,

ගම්පහ.

දුරකථන : 033-2239794

කතුවරයාගේ සටහන

තථාගත අමා මෑණී ලොවුතුරා බුදුරජාණන් වහන්සේ විසින් වදාළ ශ්‍රී ර්මය අචින්තය, අනන්තය, අප්‍රමාණය. මෙම උතුම් දහම තුළ ඇති දහම් රුණු අංගුත්තර නිකාය ආදී ග්‍රන්ථයන්ගෙන් සංඛ්‍යාත්මකව, සවිස්තරව සඳහන්ව ත. තවද වියත්, ප්‍රවීණ භික්ෂූන් වහන්සේලාද ගිහි විද්වතුන්ද ලියන්නට යෙදුනා ග්‍රන්ථ රාශියක් වෙත්. මගේ ප්‍රයත්නය එකී දහම් කරුණු අතර දහම් පාසල් සුනට මෙන්ම දිනපතා පාසල් සිසුන්ගේ බුද්ධ ධර්මය විෂයට උපකාරයක් නනාවූද, නිතර විභාගයන්ට ඉලක්ක වන්නාවූද සරල දහම් කරුණු කාණ්ඩ ලෙසින් ගොනුකර දක්වීමයි. මෙහිදී විනය කරුණුද අභිධර්මයේ ගැඹුරු කරුණුද, වන් ඒ වැනි සිසුනට නම් විභාගයන්ට අදාල පෙළපොත්හි සඳහන් නොවන හම කරුණුද ඇතුළත් කෙළෙමි. අංක 1 සිට 10 දක්වා පමණක් සඳහන් කළේ හම් පාසල් සිසුවෙකු වශයෙන් බෞද්ධාචාර්යය විභාගයෙන් ගෞරව සාමාර්ථයක් බන තෙක්ද, පොලිස් සේවයට බැඳීමට පෙර හා විශ්‍රාම ලද පසුව වත්මනයෙහිද හම් පාසල් ආචාර්යවරයෙකු ලෙසින් ලබන අද්දැකීම් හා පළපුරුදු සම්භාරයක් ැති නියාවෙනි.

මෙම ග්‍රන්ථය තුළින් සිසුවෙකු හට තමන්ට අවශ්‍ය දහම් කරුණු අර්ථයන්ද හිතව සොයාගතහැකි වනු ඇත. තවද යම් වාචික ප්‍රශ්න කිරීමක දී හෝ විභාගයකදී සුන් බොහෝ විට දහම් කරුණු ප්‍රකාශ කරන්නේ හෝ ලියන්නේ පිළිවෙලින් නාව නම මතකයට එන අයුරින් බව අද්දැකීමෙන් දනිමි. බුදු දහමේ දක්වා ඇති රුණු බොහෝ විට සඳහන්ව ඇත්තේ පළමුව සඳහන් කරුණෙහි ප්‍රතිඵලයක් ලෙස දෙවන කරුණ යෙදෙන බව නිසා අපිළිවෙළින් ප්‍රකාශ කළහොත් හෝ යතහොත් සියල්ල අවුල් සහගත වන්නේ ය. මෙම ග්‍රන්ථය සිසුන්ගේ එම ැටළුවටද විසඳුම් සපයා ඇත.

සිසුනට පමණක් නොව බුදු දහම ගැන විමසන උනන්දු වන කා හටත් කසේ ප්‍රයෝජනවත් වන අත් පොතක් ලෙස මෙය භාවිතා කළහැකි වනු ඇති ව මාගේ විශ්වාසයයි.